සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 20/2020

මගේ අංකය - PPSC/ES/10/FI/06/01-1
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත - රත්නපුර.
2020.10.12

01. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව
02. ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්, සබරගමුව පළාත් සභාව.
03. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, සබරගමුව පළාත.
04. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, රත්නපුර/කෑගල්ල.

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියට නියමිත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ. එබැවින් එම විභාගය සඳහා ඉදිරිපත් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයගේ අයදුම්පත් 2020.10.28 වන දිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

02. මෙම චක්‍රලේඛ ලිපියේ පසු පිටේ සඳහන් ආදර්ශ අයදුම්පත ප්‍රකාර සකස් කරගත් අයදුම්පතක් මගින් විභාගයට අයදුම් කළයුතු වේ. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ඉදිරියේ අයදුම්කරු අත්සන් කර ඔහුට භාරදිය යුතුය. ආයතන ප්‍රධානියා විසින් එම අයදුම්පත 2020.10.28 දිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

03. විභාගයෙන් සමත්වීම සඳහා එක් විෂයයකින් ලකුණු 40% බැගින් ලබාගත යුතුය. දෙවරකදී වුවද නියමිත විෂයයන් වලින් සාමාර්ථය සම්පූර්ණ කරගත හැකිය.

04. ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| 2.මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |

සටහන - (අ) එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාර වලදී පෙනී සිටීමට නිලධාරියාට හැකිවේ.

(ආ) අදාල සේවයට ඇතුලත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුවේ.

විෂය නිර්දේශය

(1) ආයතන සංග්‍රහය - ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩය හා 11 වන කාණ්ඩය

(2) මුදල් රෙගුලාසි - රජයේ කාර්යාල වල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ දැනුම

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර

ආදර්ශ අයදුම්පත

තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පංතියේ 11ශ්‍රේණියට අදාල
කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01 අයදුම්කරුගේ සම්පූර්ණ නම: -

02 මුලකුරු සමඟ නම : -
(මියා/මිය/මෙනවිය යනුවෙන් සඳහන් කරන්න)

03 දැනට සේවය කරන ස්ථානයේ රාජකාරී ලිපිනය :-

04 දුරකථන අංකය : - 1. රාජකාරී............................
2. පෞද්ගලික..........................

05. මුල් පත්වීම් දිනය : -

06. ජාතික හැඳුනුම්පත් අංකය:-

07. තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පංතියේ 11 ශ්‍රේණියට පත් කළ දිනය :-

08. විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන්: -

09. විභාගයට පෙනී සිටින මාධ්‍යය:-

10. විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය: -

අයදුම්පතේ සඳහන් ඉහත කරුණු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය අයදුම්කරුගේ අත්සන

අයදුම්කරු සේවය කරන ආයතන ප්‍රධානියාගේ සහතිකය

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම් කාර්යාලයේ සේවය කරන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පංතියේ 11 ශ්‍රේණියේ නිලධාරියෙකු බවත්, ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති අයෙකු බවත්, ඔහු/ඇය මා ඉදිරියේදී මෙම අයදුම්පත්‍රයේ අත්සන් තැබූ බවත් මින් සහතික කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

දිනය -